# කර්මාන්ත

## සමස්ත උපනතීන්

නිෂ්පාදන සහ අපනයන මට්ටම්වල වැඩිවීම් වාර්තා කරමින් කර්මාන්ත අංශය 1992 වර්ෂයේදී එහි වර්ධන සීඝ්‍රතාවය නොකඩවා පවත්වාගෙන ගියේය. 1991 දී මූර්ත වශයෙන් සියයට 10 කින් වර්ධනය වූ කාර්මික නිමැවුම 1992 වර්ෂයේදී සියයට 12 කින් වැඩිවිය. මෙම වර්ධනය මුළුමනින්ම පාහේ උත්පාදනය වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්ත වලිනි. 1985 වර්ෂයේ ඉතා ඉහළ වර්ධන මට්ටමක් වාර්තා කිරීමෙන් පසුව, පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි වර්ධනය මූර්ත වශයෙන් සියයට 20 කින් ඉහළ නැඟුණි. මෙයට ප්‍රතිවිරුද්ධව, රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම සියයට 19කින් පහත වැටුණි.

පෞද්ගලික අංශය තුළ විශාල වර්ධනයක් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්; රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික්; ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත සහ කඩදාසි නිෂ්පාදිත යන ඒවාය. 1992 දී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමේ සැලකිය යුතු පහත වැටීමට ප්‍රධාන හේතු වූයේ රාජ්‍ය අංශයේ වැදගත් කර්මාන්ත ගණනාවක්ම පෞද්ගලීකරණය කිරීම නිසා ඒවායේ නිමැවුම් වටිනාකම පෞද්ගලික අංශයේ කාර්මික නිමැවුමට එකතු වීමත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ නිෂ්පාදනයේ වූ තදබල පහත වැටීමත් ය.

කාර්මික අපනයනයන්ගේ අගය 1991 දී රුපියල් දශ ලක්ෂ 50,736 සිට 1992 රුපියල් දශ ලක්ෂ 75,776 දක්වා ඉහළ ගියේය. මුළු කාර්මික අපනයන ඉපැයුම් තුළ අන්තර්ගත රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් කොටස 1991 දී සියයට 66 සිට 1992 දී සියයට 69 දක්වා වැඩි වුණි.

## කාර්මික ප්‍රතිපත්තිය

සීමිත කලාප හෝ ප්‍රදේශවල සිට මුළු රටටම ව්‍යාප්ත වන පරිදි දේශීය හා විදේශීය ආයෝජනයන් සම්බන්ධ ප්‍රවර්ධන සහ පහසුකම් සැපයීම පිළිබඳ වැඩි වගකීමක් සහිතව 1992 නොවැම්බර් මාසයේදී මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) ආයෝජන මණ්ඩලයක තත්වයට උසස් කරන ලදී. සංවර්ධනය අඩු ප්‍රදේශවලට ආයෝජනයන් ඇද ගැනීමේ සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ අදහස ඇතිව 1992 පෙබරවාරි මාසයේදී නව සානුබල සමුදායක් හඳුන්වා දෙන ලදී. ප්‍රාදේශීය සභා ප්‍රදේශවල අපනයන මුල් කරගත් ඇඟළුම් කර්මාන්තශාලා 200 ක් පිහිටුවීමේ යෝජනා ක්‍රමයක් 1992 දී ආරම්භ කරන ලදී. ප්‍රාදේශීය මට්ටමින් කර්මාන්ත සහ ඊට සම්බන්ධ කටයුතු නඟා සිටුවීම, පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණය සඳහා 1990 කාර්මික ප්‍රවර්ධන පනත යටතේ, ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු හතක් 1992 මාර්තු මාසයේදී පිහිටුවන ලදී.

පුරෝගාමී කර්මාන්ත සඳහා දෙනු ලැබූ බදු සහන වලට ප්‍රතිචාරයක් ලෙස 1992 දෙසැම්බර් වන විට නව කර්මාන්ත 86 ක් සහ දැනට ක්‍රියාත්මක වන ධාරිතාවයන් පුළුල් කරන ලද කර්මාන්ත 174 ක නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මීට අමතරව පෞද්ගලික කාර්මික ජනපද පිහිටුවීමට ද බදු සහන ලබාදුන් අතර 1992 අවසන් වන විට ඉන් 2 ක් ආරම්භ වී තිබිණි.

පෞද්ගලීකරණය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය අනුව, රාජ්‍ය ව්‍යවසායයන් ගණනාවක් සීමාසහිත සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් 1992 දී අනුමැතිය දෙන ලදී. පොහොර සංස්ථාව, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ ලිහිසි තෙල් යන්ත්‍රාගාරය, සීමාසහිත කොළඹ ගෑස් සමාගම, සීමාසහිත ලංකා පොස්පේට්, ජාතික කඩදාසි සංස්ථාව සහ ලංකා ඛණිජ වැලි සංස්ථාව පෞද්ගලීකරණය සඳහා අනුමැතිය ලැබූ ආයතන අතර විය. 1992 වසරේදී ලංකා තෙල් හා මේද සංස්ථාව, ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ නයිලොන් 6 යන්ත්‍රාගාරය, සීමාසහිත කැළණි ටයර්, සීමාසහිත

වේයන්ගොඩ රෙදිපිළි කම්හල, සීමාසහිත ලංකා පිඟන් සහ සීමාසහිත කහටගහ මිනිරන් යන ආයතන වල වැඩිමනත් කොටස්, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 81, රුපියල් දශ ලක්ෂ 228, රුපියල් දශ ලක්ෂ 400, රුපියල් දශ ලක්ෂ 270, රුපියල් දශ ලක්ෂ 112 සහ රුපියල් දශ ලක්ෂ 16 යන වටිනාකම් වලට කැබිනට් මණ්ඩලය විසින් පත්කළ ටෙන්ඩර් මණ්ඩල මගින් විකුණන ලදී. සීමාසහිත පූගොඩ රෙදිපිළි කම්හල, සීමාසහිත ලංකා ඔක්සිජන් සහ ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් යන ව්‍යවසායයන්ගේ වැඩිමනත් හෝ ඉතිරි කොටස් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 1.06, රුපියල් දශ ලක්ෂ 0.62 සහ රුපියල් දශ ලක්ෂ 1,053 යන වටිනාකම්වලට සමස්ත කොටස් ප්‍රමාණයටම ලංසු තැබීමේ පදනම යටතේ කොටස් වෙළඳපළ මගින් විකුණන ලදී. මීට අමතරව ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් සමාගමේ රුපියල් දශ ලක්ෂ 495 ක වටිනාකම ඇති කොටස් සහ සීමාසහිත බෝගල මිනිරන් සමාගමේ රුපියල් දශ ලක්ෂ 112 ක වටිනාකම ඇති කොටස් 1992 මුල් භාගයේදී මහජනතාව වෙත නිකුත් කරන ලදී.

නිෂ්පාදනය

1992 වර්ෂයේදී කාර්මික නිමැවුම් වටිනාකම මූර්ත වශයෙන් සියයට 12 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඛනිජ තෙල් නිමැවුම් වටිනාකම බැහැර කළ විට කාර්මික නිෂ්පාදනයේ ඇස්තමේන්තු කළ වැඩිවීම සියයට 16 ක් විය.

1992 දී නිෂ්පාදනයේ වැඩිවීම් වාර්තා කළ කාර්මික උප අංශයන් වූයේ: රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 31); ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 20); දැව හා දැව නිෂ්පාදිත (සියයට 15); කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත සහ මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 14 බැගින්); සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 9) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 1). රසායනික, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 5) අංශය පමණක් නිමැවුමේ පහත වැටීමක් වාර්තා කළේය.

පෞද්ගලික අංශයේ කර්මාන්ත වල සමස්ත නිෂ්පාදනය පසුගිය වර්ෂයේ සියයට 14 ක වර්ධනය හා සැසඳීමේදී 1992 වර්ෂයේදී සියයට 20 ක වර්ධනයක් වාර්තා කළේය. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත යන කාර්මික නිෂ්පාදිත ගණයයන් තුනෙන් මෙම වර්ධනය විශාල වශයෙන් ජනිත විය.

රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාර්මික උප අංශයේ සමස්ත නිමැවුම මුළුමනින්ම පාහේ ඇති වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්ත වලිනි. සම් නිෂ්පාදනය කිරීමේ ඒකකය සහ රාජ්‍ය අංශයේ රෙදි කර්මාන්තශාලා තුනක් පෞද්ගලීකරණය කිරීමද මෙයට හේතු විය. දේශීය වෙළඳපොලට රෙදිපිළි සපයන කුඩා හා මධ්‍යම පරිමාණ රෙදිපිළි කර්මාන්තවල ක්‍රියාකාරිත්වයේ වර්ධනය සහ ආයෝජන ප්‍රවර්ධන කලාප තුළ සහ ඉන් පිටත අපනයන මුල් කරගත් ඇඟළුම් කර්මාන්තයේ සීඝ්‍ර ප්‍රසාරණය, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත කාර්මික ගණයේ විශාල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 1992 වර්ෂය තුළදී මෙම අංශයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ශ්‍රී ලංකාවේ මුළු ඇඟළුම් අපනයන වලින් සියයට 35 ක් වන යුරෝපා ආර්ථික හවුලේ (යු.ආ.හ.) රටවලට අපනයන කළ ඇඟළුම් වලින් පංගුවලට අයත් නොවන ඇඟලුම් අපනයන වල ඇති වූ සීඝ්‍ර ප්‍රසාරණයයි. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාර්මික උප අංශයේ මුළු නිමැවුමෙන් සියයට 80 කට වඩා දායක වන පෞද්ගලික අංශයේ කර්මාන්ත 1992 දී වැඩිදියුණු වූ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. මැණික් සහ දියමන්ති කැපීම සහ ඔප දැමීම, ඇස්බැස්ටස්, සිමෙන්ති සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදනය කළ පෞද්ගලික අංශයේ කර්මාන්ත වලින් ඉහළ නිමැවුම් මට්ටම් වාර්තා විය. කෙසේ වුවද, වීදුරු සහ වීදුරු නිෂ්පාදිත කර්මාන්තයේ නිමැවුමේ පහත වැටීමක් වාර්තා කළේය.

1992 වසරේදී රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත උප ගනයේ පෞද්ගලික අංශයේ කොටස, මෙම ගණයේ මුළු නිමැවුමෙන් අඩකට

ආසන්න ප්‍රමාණයකට වැඩිවූයේ ටයර් සංස්ථාවේ අයිතිය මාරුවීමත්, මෙම ගණයේ රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුම පහත වැටීමත් නිසාය. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, සබන්, සුවඳ විලවුන්, තීන්ත සහ වාර්නිෂ්, කෘෂි රසායනික සහ පොහොර නිෂ්පාදනයේ යෙදී සිටි පෞද්ගලික අංශයේ කර්මාන්ත වලින්ද ඉහළ නිෂ්පාදිත මට්ටම් වාර්තා විය.

යන්ත්‍රෝපකරණ, කේබල් හා විදුලිමය උපකරණ සහ සකස් කළ ලෝහ භාණ්ඩ නිෂ්පාදනය කළ පෞද්ගලික අංශයේ කර්මාන්තවල ක්‍රියාකාරීත්වයේ වර්ධනය සකස් කළ ලෝහ නිෂ්පාදිත අංශයේ නිමැවුම වැඩි වීමට මුළුමනින්ම හේතුවිය. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත ගණයෙහි මුළු නිමැවුමෙන් තුනෙන් දෙකකටම දායක වූයේ පෞද්ගලික අංශයේ කර්මාන්තයන්ය. කේබල, කාඩ්බෝඩ් පෙට්ටි සහ ලියුම් කවර මුද්‍රණය [illegible] කිරීමේ නියැලුනු පෞද්ගලික අංශයේ කර්මාන්ත වලින් ඉහළ නිමැවුම් ම[illegible]

ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාර්මික අනු අංශයේ නියුතු පෞද්ගලික අංශයේ කර්මාන්ත දුර්වල නිෂ්පාදන ක්‍රියාකාරීත්වයක් 1992 දී වාර්තා කළේය. මෙයට බලපෑ එක් හේතුවක් වූයේ වසරේ මුල් කාලයේදී පැවති දීර්ඝ නියඟයයි. දුම්කොළ, සීනි, මත්පැන් සහ කිරි නිෂ්පාදිත යන ඒවායේ නිෂ්පාදනය විශාල වශයෙන් පහත වැටීම පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ප්‍රසාරණය අඩුවීමට හේතු විය. මාංශ නිෂ්පාදන, බිස්කට්, පිටි සහ රසකැවිලි නිෂ්පාදනයෙහි යෙදී සිටි කර්මාන්තවල ඉහල මට්ටමක ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය.

පවත්නා මිළ ගණන් අනුව 1992 දී සමස්ත කාර්මික නිෂ්පාදන වටිනාකම සියයට 23 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත වටිනාකම සියයට 45 කින් ද; දැව හා දැව නිෂ්පාදිත සියයට 25 කින් ද; ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත සියයට 21 කින් ද; සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත සියයට 17 බැගින් ද, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සියයට 14 කින් ද, මූලික ලෝහ නිෂ්පාදිත සහ අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත සියයට 12 බැගින් ද වැඩි විය.

### 1.18 සංඛ්‍යා සටහන
### කාර්මික නිෂ්පාදන වටිනාකම 1988 - 1992


(පවත්නා මිළ ගණන් අනුව) (රුපියල් දශ ලක්ෂ)

| කාර්මික ගණය | 1988 | 1989 | 1990 | 1991(ආ) | 1992 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 14,675 | 18,458 | 21,955 | 30,003 | 34,157 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 18,166 | 22,073 | 27,930 | 33,854 | 48,929 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 640 | 667 | 721 | 802 | 1,005 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,492 | 1,456 | 1,880 | 2,214 | 2,586 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 13,681 | 12,041 | 21,215 | 20,140 | 21,217 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 2,267 | 6,007 | 7,554 | 8,181 | 9,892 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 487 | 792 | 1,006 | 1,264 | 1,417 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 2,477 | 3,182 | 4,199 | 5,093 | 5,948 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 178 | 231 | 296 | 2,373 | 2,658 |
| එකතුව | 54,063 | 64,907 | 86,756 | 103,924 | 127,809 |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

## රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

## රාජ්‍ය අංශයේ කර්මාන්ත

පසුගිය වර්ෂයේ සියයට 8 ක පහත වැටීම සමඟ සැසඳීමේදී, 1992 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම මූර්ත වශයෙන් සියයට 19 කින් පහත වැටුණි. රාජ්‍ය අංශයේ මුළු කාර්මික නිමැවුමෙන් සියයට 65 ක් වන ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ නිමැවුම සැළකිය යුතු ලෙස පහත වැටීම සහ රාජ්‍ය අංශයේ වැදගත් කාර්මික ව්‍යවසායයන් ගණනාවක් පෞද්ගලීකරණය කිරීමේ ඒකාබද්ධ ප්‍රතිඵලය වූයේ 1992 දී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම තියුණු ලෙස පහත වැටීමයි. ඛණිජ තෙල් නිෂ්පාදිතයේ අගය අත්හළ විට රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි නිමැවුම සියයට 22 කින් පහත වැටුණි.

### 1.19 සංඛ්‍යා සටහන

### රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය 1990 - 1992

(1977=100)

| කාර්මික ගණය | 1990 | 1991 | 1992 (අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 22.6 | 18.3 | 13.4 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 96.0 | 66.6 | 27.5 |
| 2.1 රෙදිපිළි | 128.6 | 90.5 | 37.9 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 27.4 | 12.3 | 20.5 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 118.1 | 137.4 | 156.6 |
| 5. රසායනික නිෂ්පාදිත | 122.4 | 111.9 | 87.6 |
| 5.1 ඛනිජ තෙල් | 124.3 | 113.1 | 92.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 137.5 | 143.5 | 142.4 |
| 6.1 සිමෙන්ති | 156.6 | 171.4 | 179.8 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 80.3 | 111.5 | 125.7 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 33.6 | 17.4 | - |
| සියළුම ගණයයන් | 100.0 | 91.6 | 73.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර | 73.1 | 67.6 | 52.5 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිමැවුම් පහත වැටීම් වාර්තා කළ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් වූයේ: රාජ්‍ය රබර් නිෂ්පාදන (සියයට 40), ලංකා ඛණිජ තෙල් (සියයට 18), ලංකා ඛණිජ වැලි (සියයට 34) සහ ලංකා පිහන් (සියයට 3).

ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ නිමැවුම සැලකිය යුතු ලෙස පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ එහි පිරිපහදුවේ බොර තෙල් පෙරුම් ඒකකය ප්‍රධාන නවීකරණයක් සඳහා 1992 දෙවෙනි භාගයේදී සති 14 ක් වසා තැබීමය. වර්ෂය තුළ පැවති අයහපත් කාලගුණ තත්වයන්හි ප්‍රතිඵල වශයෙන් සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සමාගමේ නිමැවුම අඩු විය. කලාපයේ අයහපත් ආරක්‍ෂක තත්වයන් නිසා ප්‍රධාන වශයෙන් ඛණිජ වැලි සැපයුම අඩු වීම හේතුකොට ගෙන ලංකා ඛණිජ වැලි සමාගමේ නිමැවුම පහත වැටුණි.

වර්ෂය තුළදී නිෂ්පාදන වැඩිවීම් වාර්තා කළ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් වූයේ: ලංකා ලුණු (සියයට 159), රාජ්‍ය දැව (සියයට 66), ජාතික කඩදාසි (සියයට 14), ලංකා වානේ (සියයට 13) සහ ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 5).

වර්ෂය තුළදී සිල්පර, සම්ප්‍රේෂණ කණු සහ ඉරූ දැව සඳහා ඉල්ලුම ප්‍රධාන වශයෙන් වැඩිවීම හේතුකොට ගෙන රාජ්‍ය දැව සංස්ථාවේ නිමැවුම සැළකිය යුතු ලෙස වැඩි විය. වාලච්චේනේ සහ ඇඹිලිපිටිය කර්මාන්තශාලා දෙකෙහි ක්‍රියාකාරීත්වයෙහි වර්ධනය ජාතික

කඩදාසි සංස්ථාවේ නිෂ්පාදනය වැඩි වීමට හේතු විය. වර්ෂය තුළදී පැවති සතුටුදායක කාලගුණික තත්වයන්හි ප්‍රතිඵලයක් වශයෙන් සීමාසහිත ලංකා ලුණු සමාගමේ නිෂ්පාදන මට්ටම වැඩි විය. වර්ෂය පුරාම ප්‍රමාණවත් පරිදි පැවති අමුද්‍රව්‍ය සැපයුම නිසා ලංකා වානේ සංස්ථාවේ නිෂ්පාදන මට්ටම වැඩි දියුණු විය.

රාජ්‍ය ව්‍යවසායයන්හි ආංශික වර්ගීකරණය අනුව, 1992 දී දැව හා දැව නිෂ්පාදිත අංශය වැඩිම වර්ධනය (සියයට 66) වාර්තා කළේය. වැඩි වූ නිමැවුම් මට්ටම් වාර්තා කළ අනෙකුත් අංශයන් වූයේ; කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 14) සහ මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 13). නිමැවුමේ පහත වැටීම් වාර්තා කළ අංශයන් වූයේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 26); රසායනික ද්‍රව්‍ය නිෂ්පාදිත (සියයට 22) සහ ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත (සියයට 1).

## 1.20 සංඛ්‍යා සටහන

### කාර්මික ව්‍යවසායයන්ට කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1990 - 1992

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992(අ) | 1990 | 1991 | 1992(අ) | 1990 | 1991 | 1992(අ) |
| 1. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය | 35.4 | - | - | - | - | - | 35.4 | - | - |
| 2. රාජ්‍ය පොහොර සංස්ථාව | - | - | - | - | 0.1 | - | - | 0.1 | - |
| 3. ජාතික පේෂකර්ම සංස්ථාව | 42.0 | 42.0 | 42.0 | - | - | - | 42.0 | 42.0 | 42.0 |
| 4. ලංකා තුනී ලැලි සංස්ථාව | - | - | - | - | 4.0 | - | - | 4.0 | - |
| 5. ජාතික කඩදාසි සංස්ථාව | - | - | 32.0 | - | - | - | - | - | 32.0 |
| එකතුව | 77.4 | 42.0 | 74.0 | - | 4.1 | - | 77.4 | 46.1 | 74.0 |

(අ) අනුමත ඇස්තමේන්තු

මූලය: මහා භාණ්ඩාගාරය

වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්ට කළ අයවැය සංක්‍රාම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 74 ක් විය. මෙය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 61 ක වැඩිවීමකි. වර්ෂය තුළදී ප්‍රාග්ධන සංක්‍රාම වශයෙන් රුපියල් දශ ලක්ෂ 42 ක් සහ රුපියල් දශ ලක්ෂ 32 ජාතික පේෂකර්ම සංස්ථාව සහ ජාතික කඩදාසි සංස්ථාව පිළිවෙලින් ලබා ගත්තේය.

එකතු වූ අගය.

පවත්නා මිල ගණන් අනුව, පසුගිය වර්ෂයේ සියයට 23 ක වර්ධනය සමඟ සැසඳීමේදී 1992 දී කර්මාන්තයන්හි එකතු වූ අගය සියයට 24 කින් වැඩි විය. කර්මාන්තශාලාවෙන් පිටවන විට නිමැවුමේ වටිනාකමෙන් අමුද්‍රව්‍ය වියදම් සහ බලය සහ ඉන්ධන වියදම් අඩු කිරීමෙන් එකතු වූ අගය ලබාගනු ලැබේ.

## 1.21 සංඛ්‍යා සටහන

## කර්මාන්ත අංශයේ එකතු වූ අගය 1988 - 1992

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1988 | 1989 | 1990 | 1991(ආ) | 1992(අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 8,225 | 10,168 | 12,065 | 15,070 | 17,340 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 4,797 | 5,746 | 7,167 | 8,542 | 13,260 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 463 | 496 | 485 | 571 | 677 |
| 4. කඩදසි හා කඩදසි නිෂ්පාදිත | 751 | 745 | 1,019 | 1,167 | 1,397 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 3,827 | 3,531 | 2,428 | 3,199 | 3,416 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 1,308 | 1,218 | 4,742 | 4,905 | 5,918 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 71 | 77 | 194 | 248 | 263 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,518 | 1,969 | 2,746 | 3,247 | 3,629 |
| 9. අන් තැන සඳහන් නොවූ නිෂ්පාදිත | 90 | 117 | 138 | 1,092 | 1,196 |
| එකතුව | 21,050 | 24,067 | 30,984 | 38,041 | 47,096 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

1992 දී නිෂ්පාදන කර්මාන්තවල මුළු එකතු වූ අගය රුපියල් දශ ලක්ෂ 47,096 ක් විය. නිෂ්පාදන වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට, සාමාන්‍ය එකතු වූ අගය 1992 දී සියයට 37 ක් විය. 1991 දී ද මෙම අනුපාතයම වාර්තා විය. එකතු වූ අගයේ අනුපාතය සියයට 50 කට වඩා වැඩි කාර්මික ගණයයන් වූයේ දැව හා දැව නිෂ්පාදිත (සියයට 67); සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 61); ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත (සියයට 60), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 54) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 51). එකතු වූ අගයේ අනුපාතය සියයට 50 ට වඩා අඩුවූ කාර්මික ගණයයන් වූයේ, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 27); මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 19) සහ ඛණිජ තෙල් සහ රසායනික නිෂ්පාදිත (සියයට 16) යන කාර්මික ගණයයන්ය.

### බලය සහ ඉන්ධන

ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද විකුණුම් අත්හල විට 1992 වසරේදී කර්මාන්තයන්ට අලෙවි කරන ලද ඉන්ධන වටිනාකම සියයට 21 කින් වැඩි විය. 1992 දී උඳුන් තෙල් අලෙවිය සියයට 16 කින් ද, බැර ඩීසල් අලෙවිය සියයට 65 කින් ද වැඩි විය.

## 1.22 සංඛ්‍යා සටහන

## කර්මාන්තයන්හි බලය හා ඉන්ධන භාවිතය 1991 - 1992

| අයිතමය | 1991 (ආ) | 1992 (අ) |
|---|---|---|
| 1. විදුලි බල (ගිග වොට් පැය) (ඇ) | 958.3 | 1,047.4 |
| 1.1 කුඩා කර්මාන්ත | 67.4 | 74.7 |
| 1.2 මධ්‍යම කර්මාන්ත | 494.3 | 504.3 |
| 1.3 විශාල කර්මාන්ත | 396.6 | 468.4 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (මෙ.ටො. දහස්) (ඈ) | 192.2 | 231.8 |
| 2.1 බැර ඩීසල් | 17.7 | 29.2 |
| 2.2 උදුන් තෙල් | 174.5 | 202.6 |

මූලයන්: ලංකා විදුලි බල මණ්ඩලය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) කාර්මික නිෂ්පාදන හා අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයකින් යුත් කර්මාන්තද කුඩා කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 50-500 අතර ගැණෙන ඒවා මධ්‍යම කර්මාන්ත වශයෙන්ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 500 ට වැඩි ඒවා විශාල කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.
(ඈ) ලංකා විදුලි බල මණ්ඩලය හැර සෙසු ආයතනවලට කෙරුණු විකිණීම්.

1992 වර්ෂයේදී කර්මාන්ත අංශයේ විදුලිබල භාවිතය සියයට 9 කින් වර්ධනය විය. මෙය කුඩා පරිමාණ කර්මාන්තයන්හි සියයට 11 ක, මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි සියයට 2 ක සහ විශාල පරිමාණ කර්මාන්තයන්හි සියයට 23 ක වර්ධනයන්හි සංකලනයකි.

### කර්මාන්ත වලට පහසුකම්

විමර්ශණයට භාජනය වූ 1992 වර්ෂය තුළදී ද කර්මාන්ත අංශයට සහනදායි කොන්දේසි මත මූල්‍යමය ආධාර නොකඩවා ලැබුණි. ජාතික සංවර්ධන බැංකුවේ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ණය සහතික යෝජනා ක්‍රමය (සුමක) කර්මාන්ත අංශයට මූල්‍ය පහසුකම් සපයනු ලබන ප්‍රධාන ප්‍රතිමූල්‍ය වැඩ පිළිවෙල ලෙස ක්‍රියාත්මක විය. මෙයට අමතරව ලංකා සංවර්ධන මුදල් සමායතනය (ලං.සං.මු.ස.) ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) සහ වානිජ බැංකු කර්මාන්තකරුවන් සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගීත්වය තුළින් සෘජු මූල්‍ය පහසුකම් සපයනු ලැබිණ.

ශ්‍රී ලංකා මහ බැංකුව 1992 දෙසැම්බර් අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 5,005 ක ණය මුදල් ආවරණය වන පරිදි කුඩා පරිමාණයේ කර්මාන්ත සහ සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත (සු.ම.ක.) i, ii, iii සහ iv වෙනුවෙන් සුරැකුම් 10,718 ක් නිකුත් කර තිබුණි. වසර අවසානය වන විට ණයකර 3,157 ක් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 774 ක් සම්පූර්ණයෙන්ම අයකර ගෙන තිබුණි.

නොපිය වූ ණය සලකා බලන කල ප්‍රදානය කරන ලද ණය 6,200 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 2,267 ක් හිඟව පැවතිණි. 1992 අවසානය වන විට මහ බැංකුව විසින් හිමිකම් පෑම් 416 ක් පියවීම සඳහා රුපියල් දශ ලක්ෂ 49 ක මුදලක් ගෙවා තිබුණි.

## 1.23 සංඛ්‍යා සටහන

### 1992 ජාතික සංවර්ධන බැංකුව විසින් සැපයීමට අනුමැතිය දී ඇති ප්‍රතිමූල්‍ය සහ මූල්‍ය පහසුකම්

| කාර්මික ගණය | ප්‍රතිමූල්‍ය අනුමත කිරීම IV සු.ම.ක යෝජනා ක්‍රමය | | සෘජු මූල්‍ය පහසුකම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ | සංඛ්‍යාව | වටිනාකම රුපියල් දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 442 | 217.46 | 24 | 416.54 | 466 | 634.00 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 197 | 143.85 | 95 | 1,182.99 | 292 | 1,326.84 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 131 | 47.66 | 7 | 14.04 | 138 | 61.70 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 72 | 40.72 | 2 | 50.00 | 74 | 90.72 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 64 | 55.61 | 26 | 184.51 | 90 | 240.12 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 107 | 41.35 | - | - | 107 | 41.35 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 159 | 80.36 | 43 | 606.86 | 202 | 687.22 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 911 | 379.62 | 115 | 1,552.51 | 1,026 | 1,932.13 |
| එකතුව | 2,083 | 1,006.63 | 312 | 4,007.45 | 2,395 | 5,014.08 |

මූලය: ජාතික සංවර්ධන බැංකුව

ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) ණය සහ ප්‍රාග්ධන සහභාගිත්වය තුළින් කාර්මික ව්‍යාපෘතීන් සඳහා සෘජු මූල්‍යාධාර සැපයීය. 1991 දී රුපියල් දශ ලක්ෂ 2,771 ක සෘජු මූල්‍යාධාර සපයමින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් 213 හා සසඳන කල ජා.සං.බැ. විසින් 1992 දී රුපියල් දශ ලක්ෂ 4,007 සෘජු මූල්‍යාධාර ඇතුළත් ව්‍යාපෘතීන් 312 ක් සඳහා අනුමැතිය දී ඇත. මෙම මූල්‍යමය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික ගණයයන් වූයේ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත, මූලික ලෝහ නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත යනාදියයි.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය කර්මාන්ත අංශය සඳහා ණය සහ ප්‍රාග්ධන සහභාගීත්වය වශයෙන් රුපියල් දශ ලක්ෂ 2,577 ක වටිනාකමක් සහිත ව්‍යාපෘතීන් 331 ක් සඳහා අනුමැතිය දෙන ලදී. මෙම මූල්‍යමය පහසුකම් වලින් ප්‍රධාන කොටසක් ලබාගත් කාර්මික ගණයයන් වූයේ ආහාර පාන වර්ග සහ දුම්කොළ, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත යනාදියයි.

වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශය සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම 1992 වර්ෂයේදී ද නොකඩවා කරගෙන යනු ලැබිණි. 1992 මුල් මාස 9 තුළ, කාර්මික කටයුතු සඳහා සැපයුණු වාණිජ බැංකු අත්තිකාරම් සියයට 7 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 13,483 සිට රුපියල් දශ ලක්ෂ 14,441 දක්වා වැඩි විය.

## පෞද්ගලික විදේශීය ආයෝජනය

ඒකීය ආයෝජන ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, (ශ්‍රී.ලං.ආ.ම.) දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම දෙකක් යටතේ පුළුල් පරාසයක දිරි දීමනා සහ සහන සැපයීම් නොකඩවා පවත්වාගෙන යන ලදී. 1992 වර්ෂය තුළදී මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 17 වන වගන්තිය (විශේෂ දිරි දීමනා යෝජනා ක්‍රමය) යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යාපෘතීන් 291 ක් අනුමත කළ අතර, වර්ෂය අවසානය වන විට අනුමත කළ මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාව 702 දක්වා වැඩි විය. මෙයින් ව්‍යවසායයන් 398 ක් විවිධ කර්මාන්තයන් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ඇති කර ගන්නා ලද ඒවා විය. 1992 වර්ෂය අවසානය වන විට, වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියැලුණු ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 211 ක් විය. නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබූ ව්‍යාපෘතීන් අතරින් 79 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක.ආ.ප්‍ර.ක.) තුළද, 38 ක් බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය (බි.ආ.ප්‍ර.ක.) තුළද, 8 ක් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය (කො.ආ.ප්‍ර.ක.) තුළ සහ ඉතිරි 86 දිවයිනේ සෙසු ප්‍රදේශ වල ද පිහිටුවා තිබුණි.

1992 අවසානය වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්හි නියුතු මුළු සේවක සංඛ්‍යාව 104,220 ක් වූ අතර, 1992 වසරේ එහි වර්ධනය සියයට 22 ක් විය. මෙම සංඛ්‍යාවෙන් 65,465 ක් හෙවත් සියයට 63 ක් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදන අංශයේ යෙදී සිටියහ. ඇඟළුම් නොවන අංශයේ ව්‍යවසායයන්ගේ සාපේක්ෂ සේවා නියුක්තිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ගේ මුළු සේවක සංඛ්‍යාවෙන් 1991 වසරේදී සියයට 37 සිට 1992 වසරේදී සියයට 40 දක්වා වැඩි විය. රැකියා උත්පාදනයේ ඉහළ අනුපාතයන් වාර්තා කරන ලද්දේ රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත යන කාර්මික ගණයයන්හි ය.

1992 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කළ ව්‍යාපෘතීන්ගේ අපේක්ෂිත මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17,610 ක් වූ අතර, ජපානය, කොරියාව, සිංගප්පූරුව, හොංකොං, ඉතාලිය, තායිවානය, මලයාසියාව, ජර්මනිය, පකිස්ථානය, බර්මියුඩාව, නෙදර්ලන්තය සහ ඩුබායි වැනි රටවලින් විදේශ ආයෝජකයෝ පැමිණියහ. 1992 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් අතර ආයුර්වේද බෙහෙත් වර්ග, පින්තූර රාමු, මෝටර් රථ අමතර කොටස්, රබර් නිෂ්පාදිත, කපු නොවන රෙදිපිළි, සකස් කරන ලද කොහුබත් කැට, කෘත්‍රිම ඇස් පිහාටු, පුරවන ලද සෙල්ලම් බඩු, මැණික් ඔබ්බන ලද ස්වර්ණාභරණ, පාවහන්, කඩදාසි නිෂ්පාදිත, විදුලි උපකරණ, දුම්කොළ නිෂ්පාදිත සහ දියමන්ති කැපීම හා ඔප දැමීම යන නිෂ්පාදිත වර්ග අන්තර්ගත වේ.

1992 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දේශීය ආදායම් පනත සහ බදු සම්බන්ධිත නීති (සාමාන්‍ය දිරි දීමනා යෝජනා ක්‍රමය) යටතේ ව්‍යවසායයන් 78 ක් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතීන් ගෙන් අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1,766 වන අතර, එහි විදේශීය ආයෝජන දායකත්වය රුපියල් දශ ලක්ෂ 863 ක් සහ දේශීය ආයෝජන දයකත්වය රුපියල් දශ ලක්ෂ 903 ක් වේ. මෙම ව්‍යාපෘති වල අපේක්ෂිත සේවා නියුක්තිය පුද්ගලයින් 6,417 ක් වේ.

1992 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ව්‍යවසායයන්හි දළ අපනයන ඉපැයුම් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 43,264 (වි.ගැ.හි. දශ ලක්ෂ 701) වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 96 ක වැඩිවීමකි. වි.ගැ.හි. වටිනාකම අනුව මෙම වර්ධනය සියයට 79 කි. 1991 වර්ෂයට වඩා මෙම වර්ෂයෙහි සියයට 84 කින් වැඩිවූ රෙදිපිළි සහ ඇඟළුම් අංශයේ අපනයන ඉපැයුම්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ව්‍යවසායයන්ගේ මුළු අපනයන ඉපැයුම් වලින් සියයට 62 ක් හිමිකර ගනිමින් ප්‍රධාන අපනයන ඉපැයුම්කරු ලෙස අඛණ්ඩව පැවතිණි. රෙදිපිළි සහ ඇඟළුම් අංශයේ එක් සේවකයෙකු වෙනුවෙන් වූ අපනයන ඉපැයුම් වටිනාකම ඉකුත් වසරේ රුපියල් 267,108 ක් ව පැවැති අතර 1992 වසරේදී එය රුපියල් 407,683 ක්

විය. විමසුමට ලක්කෙරෙන වසර තුළදී ඇහළුම් නොවන ව්‍යවසායයන්හි අපනයන ඉපැයුම් සියයට 118 කින් වැඩි විය.

## 1.24 සංඛ්‍යා සටහන

### ආයෝජන ප්‍රවර්ධන කලාප - සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1991 - 1992

| කාර්මික ගණය | 1991 | | 1992 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ. වි.ස) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට සංඛ්‍යාව) | දළ අපනයන ඉපැයුම් (නැ. වි.ස) රු. දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 2,168 | 1,235 | 2,536 | 2,361 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 54,214 | 14,481 | 65,465 | 26,689 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 52 | 10 | 58 | 17 |
| 4. කඩදාසි, කඩදාසි නිෂ්පාදිත, මුද්‍රණ සහ ප්‍රකාශන | 127 | 9 | 150 | 41 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 5,390 | 1,088 | 7,537 | 2,985 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) | 6,069 | 1,871 | 6,940 | 4,401 |
| 7. සකස් කල ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,465 | 687 | 4,652 | 1,250 |
| 8. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත | 11,055 | 1,768 | 10,711 | 4,452 |
| 9. සේවා (ආ) | 4,917 | 944 | 6,171 | 1,068 |
| එකතුව | 85,457 | 22,093 | 104,220 | 43,264 |

මූලයː ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
(අ) තාවකාලික
(ආ) 'එයාර් ලංකා' හැර

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 1992 වසර තුළදී ඉන්දියාව, නෙදර්ලන්තය, දකුණු කොරියාව, හොංකොං, ජපානය සහ සිංගප්පූරුව යන රටවල ආයෝජන ප්‍රවර්ධන කිරීමේ කාර්යයන්හි නිරත විය. ආයෝජන ව්‍යාපෘතීන් පුළුල් පරාසයක වර්ධනය කිරීමේ අරමුණ ඇතිව, ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ ගණනාවක් 1992 වසර තුළදී ශ්‍රී ලංකාවේ පැවැත්විය.